# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1717/21 - 2011 අගෝස්තු 04 වැනි බ්‍රහස්පතින්දා - 2011.08.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 3/2011.

**2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සමග කියවිය යුතු 2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනතේ 23 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග :-

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2011 අගෝස්තු මස 04 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2011 අංක 1 දරන සුරක්ෂිතලත් ගනුදෙනු නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මූලික දැන්වීමක් ගොනු කිරීමේ අදහස ඇති (මෙහි මින් මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනතේ 2 වැනි වගන්තියේ සඳහන් සුරක්ෂිතලත් පාර්ශවයන් හෝ ණයකරුවෙකු විසින් 1 වැනි උපලේඛනයේ දැක්වෙන ආකෘති පත්‍රයේ පරිදි දැන්වීමක් සුරක්ෂිතලත් ගනුදෙනු ලේඛනය වෙත විද්‍යුත් මාධ්‍ය මගින් ඉදිරිපත් කළ යුතු ය.

I වැනි උපලේඛනය

***මූලික දැන්වීමේ ආකෘති පත්‍රය***

| ණයකරුගේ විස්තර | | |
|---|---|---|
| | | |
| ණයකරු වර්ගය | | |
| නේවාසික තත්වය | | |
| ණයකරු හඳුනා ගැනීමේ අංකය | | |
| ණයකරුගේ නම | | |
| ණයකරුගේ ලිපිනය | | |

1A - G 14888— 830 (2011/08)

I වැනි උපලේඛනය (සම්බන්ධිතයි)

| | | |
|---|---|---|
| | සුරක්ෂිත ලත් පාර්ශ්වයේ විස්තර | |
| | | |
| සුරක්ෂිතලත් පාර්ශ්ව වර්ගය | | |
| සුරක්ෂිතලත් පාර්ශ්වය හඳුනා ගැනීමේ අංකය | | |
| සුරක්ෂිතලත් පාර්ශ්වයේ ලිපිනය | | |
| | | |
| සමපාර්ශවීය ද්‍රව්‍ය පිළිබඳ විස්තරය | | |
| | | |

සටහන් :

(i) *ණයකරු වර්ගය "පුද්ගලයකු" හෝ "සංස්ථාවක් " විය හැකිය ;*
(ii) *නේවාසික තත්ත්වය "දේශීය" හෝ "විදේශීය" විය හැකිය ;*
(iii) *ණයකරු හඳුනාගැනීමේ අංකය ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍ර අංකය හෝ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය විය හැකිය ;*
(iv) *නම විය යුත්තේ ජාතික හැඳුනුම්පතේ හෝ විදේශ ගමන් බලපත්‍රයේ ඇති සම්පූර්ණ නම හෝ ව්‍යාපාර ලියාපදිංචි කිරීම් සහතිකයේ ඇති සංස්ථාපිත නාමය වේ ;*
(v) *සුරක්ෂිතලත් පාර්ශ්ව වර්ගය "පුද්ගලයකු" හෝ "සංස්ථාවක් " විය හැකිය ;*
(vi) *සුරක්ෂිතලත් පාර්ශ්වකරුවකු හඳුනාගැනීමේ අංකය ලේඛනය (ක්‍රිබ්) විසින් ලබාදිය යුතුය ;*
(vii) *සමපාර්ශවීය ද්‍රව්‍යයේ විස්තරය යන්නෙන් සම්පාර්ශවය ද්‍රව්‍යය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් අදහස් වේ (චංචල වත්කම්).*

3. සුරක්ෂිතලත් ගනුදෙනු ලේඛනය වෙත ගොනු කරන ලද මූලික දැන්වීමට සංශෝධනයක් කිරීමට අදහස් කරන සුරක්ෂිතලත් පාර්ශ්වයක් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් II වැනි උපලේඛණයේ දැක්වෙන ආකෘති පත්‍රයේ පරිදි එකී සංශෝධනය සඳහා වූ දැන්වීමක් විද්‍යුත් මාධ්‍ය මගින් සුරක්ෂිතලත් ගනුදෙනු ලේඛනය වෙත ඉදිරිපත් කළ යුතුය.

II වැනි උපලේඛනය

***මූලික දැන්වීමකට සංශෝධනයක් කිරීම සඳහා වූ දැන්වීමේ ආකෘතිය***

| | |
|---|---|
| මූලික දැන්වීමේ අංකය | |
| සුරක්ෂිතලත් පාර්ශ්වයේ විස්තර | |
| සුරක්ෂිතලත් පාර්ශ්වය හඳුනාගැනීමේ අංකය | |
| සුරක්ෂිතලත් පාර්ශ්වයේ නම | |
| සුරක්ෂිතලත් පාර්ශ්වයේ ලිපිනය | |
| ණයකරුගේ විස්තර | |
| ණයකරු හඳුනා ගැනීමේ අංකය | |
| ණයකරුගේ නම | |
| ණයකරුගේ ලිපිනය | |
| | |
| සමපාර්ශවීය ද්‍රව්‍යය පිළිබඳ විස්තර | |
| | |
| බලය පවරන පාර්ශ්වයේ නම | |
| | |

II වැනි උපලේඛනය (සම්බන්ධිතයි)

සටහන් ඃ

(i) *මූලික දැන්වීමේ අංකය යන්නෙන් මූලික දැන්වීම ලියාපදිංචි කිරීමේදී ලේඛනය විසින් ලබාදෙන ලද ලිපිගොනු අංකය අදහස් වේ ;*

(ii) *සුරක්ෂිතලත් පාර්ශ්වයේ නම ලේඛනය විසින් ලබා දෙනු ඇත ;*

(iii) *සුරක්ෂිලත් පාර්ශ්වය හඳුනාගැනීමේ අංකය ලේඛනය විසින් ලබාදෙනු ඇත ;*

(iv) *සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳ විස්තර යන්නෙන් සමපාර්ශ්වීය ද්‍රව්‍ය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් අදහස් වේ ;*

(v) *ණයකරු හඳුනාගැනීමේ අංකය යන්නෙන් ජාතිත හැඳුනුම්පත් අංකය හෝ විදේශීය ගමන් බලපත්‍ර අංකය හෝ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය අදහස් වේ ;*

(vi) *නම විය යුත්තේ ජාතික හැඳුනුම්පතේ/විදේශ ගමන් බලපත්‍රයේ ඇති සම්පූර්ණ නම හෝ ව්‍යාපාර නාම ලියාපදිංචියේ ඇති ආයතනික නාමය වේ.*

4. සුරක්ෂිතලත් ගනුදෙනු ලේඛණය වෙත ගොනු කරන ලද මූලික දැන්වීමක් දිගටම පවත්වාගෙන යාමට අදහස් කරන යම් තැනැත්තකු විසින් මූලික දැන්වීම ගොනු කිරීමෙන් පසු අවුරුදු පහක කාල සීමාව අවසන්වීමට මාස හයකට පෙර III වැනි උපලේඛනයේ දැක්වෙන ආකෘති පත්‍රයේ පරිදි එකී දැන්වීම දිගටම පවත්වාගෙන යාමේ ප්‍රකාශයක් විද්‍යුත් මාධ්‍ය මගින් සුරක්ෂිතලත් ගනුදෙනු ලේඛනය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

III වැනි උපලේඛනය

***මූලික දැන්වීම දිගටම පවත්වාගෙන යාමේ ප්‍රකාශය පිළිබඳ ආකෘති පත්‍රය***

| | |
|---|---|
| මූලික දැන්වීමේ අංකය | |
| සුරක්ෂිතලත් පාර්ශ්වයේ විස්තරය | |
| සුරක්ෂිලත් පාර්ශ්වය හඳුනාගැනීමේ අංකය | |
| සුරක්ෂිතලත් පාර්ශ්වයේ නම | |
| සුරක්ෂිතලත් පාර්ශ්වයේ ලිපිනය | |
| ණයකරුගේ විස්තරය | |
| ණයකරුගේ හඳුනාගැනීමේ අංකය | |
| ණයකරුගේ (සම්පූර්ණ) නම | |
| ණයකරුගේ ලිපිනය | |
| සමපාර්ශ්වීය ද්‍රව්‍යයේ විස්තරය | |
| | |
| වලංගු කාලය | |
| සිට | |
| දක්වා වූ කාලය සඳහා | |

III වැනි උපලේඛනය (සම්බන්ධිතයි)

සටහන් :

(i) *මූලික දැන්වීමේ අංකය යන්නෙන් ලේඛනය විසින් ලබාදී ඇති ලිපිගොනු අංකය අදහස් වේ ;*
(ii) *සුරක්ෂිතලත් පාර්ශ්වයේ නම ලේඛනය විසින් ලබා දෙනු ඇත ;*
(iii) *සුරක්ෂිලත් පාර්ශ්වය හඳුනාගැනීමේ අංකය ලේඛනය විසින් ලබාදෙනු ඇත ;*
(iv) *සමපාර්ශ්වීය ද්‍රව්‍යයේ විස්තරය යන්නෙන් සමපාර්ශ්වීය ද්‍රව්‍යයේ සවිස්තරාත්මක විස්තරයක් අදහස් වේ ;*
(v) *ණයකරු හඳුනාගැනීමේ අංකය ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍ර අංකය හෝ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය විය හැකිය ;*
(vi) *නම විය යුත්තේ ජාතික හැඳුනුම්පතේ හෝ විදේශ ගමන් බලපත්‍රයේ දැක්වෙන සම්පූර්ණ නම හෝ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකයේ දැක්වෙන ආයතන නාමය වේ ;*
(vii) *සිට දක්වා වූ කාල සීමාව ලේඛනය විසින් ලබාදෙනු ඇත.*

5. සුරක්ෂිලතල් ගනුදෙනු ලේඛනයේ ගොනු කරන ලද මූලික දැන්වීමක ලියාපදිංචිය අවසන් කිරීමට අදහස් කරන යම් තැනැත්තකු විසින් තත්කාර්ය සඳහා දැන්වීමක්, II වැනි උපලේඛණයේ දැක්වෙන ආකෘතියට අනුව විද්‍යුත් මාධ්‍ය මගින් සුරක්ෂිතලත් ගනුදෙනු ලේඛනය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

IV වැනි උපලේඛනය

***මූලික දැන්වීමක් අවසන් කිරීම පිළිබඳ දැන්වීමේ ආකෘතිය***

| අවසන් කිරීමේ දැන්වීම | |
|---|---|
| දැන්වීම් අංකය | |
| විස්තරය | |
| සුරක්ෂිතලත් පාර්ශවයන්ගේ අනුමැතිය ලබාගත්තේ ද යන වග | |

සටහන් :

(i) *දැන්වීම් අංකය යනු ලේඛනය විසින් සපයනු ලබන ලිපිගොනු අංකය වේ ;*
(ii) *විස්තරය යටතේ, අවසන් කිරීම සඳහා වූ හේතු සවිස්තරාත්මකව දැක්විය යුතු ය.*

6. සමපාර්ශවීය ද්‍රව්‍යක් ඇපයට තබා ලබාලත් ණයක් පැවතීම සම්බන්ධයෙන් යම් තෙරතුරක් ලබාගැනීමට අදහස් කරන යම් තැනැත්තකු විසින් එම තොරතුරු මුදා හැරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් V වැනි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ආකෘති පත්‍රය අනුව විද්‍යුත් මාධ්‍ය මගින්, සුරක්ෂිලත් ගනුදෙනු ලේඛනය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

V වැනි උපලේඛනය

***ණය මුදලක් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා වූ ආකෘති පත්‍රය***

| | |
|---|---|
| දැන්වීම මගින් සෝදිසි කිරීම | |
| මූලික දැන්වීමේ අංකය | |
| ණයකරු විසින් සෝදිසි කිරීම | |
| ණයකරු හඳුනා ගැනීමේ අංකය | |
| ණයකරුගේ සම්පූර්ණ නම | |
| සෝදිසි කිරීම සඳහා වූ නීත්‍යානුකූල හේතු | |

V වැනි උපලේඛනය (සම්බන්ධිතයි)

සටහන් :

(i) *මූලික දැන්වීම් අංකය යන්නෙන් මූලික ලියාපදිංචියේදී ලේඛනය ලබාදුන් ලිපිගොනු අංකය අදහස් වේ ;*
(ii) *ණයකරු හඳුනාගැනීමේ අංකය යන්නෙන් ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍ර අංකය හෝ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය අදහස් වේ ;*
(iii) *නම විය යුත්තේ ජාතික හැඳුනුම්පත් හෝ විදේශ ගමන් බලපත්‍රයේ ඇති සම්පූර්ණ නම හෝ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ දැක්වෙන ආයතන නාමය වේ.*

7. පනතේ 9(i) වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක ප්‍රතිඵලයක් ලෙස සුරක්ෂිලත් ගනුදෙනු ලේඛනය විසින් තොරතුරු මුදා හැරීම VI වැනි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ආකෘති පත්‍රයට අනුව සිදු කළ යුතුය.

VI වැනි උපලේඛනය

***තොරතුරු මුදාහැරීම සඳහා වූ ආකෘති පත්‍රය***

| | |
|---|---|
| මූලික දැන්වීම් අංකය තත්වය | |
| දැන්වීම අවසන් වන දිනය | |
| ආරම්භ වන දිනය | |
| අවසාන වන දිනය | |
| ණයකරු වර්ගය | |
| ණයකරු වර්ගය | |
| නේවාසික තත්වය | |
| ණයකරු හඳුනාගැනීමේ අංකය | |
| ණයකරුගේ සම්පූර්ණ නම | |
| ණයකරුගේ ලිපිනය | |
| සුරක්ෂිතලත් පාර්ශ්වය පිළිබඳ විස්තරය | |
| සුරක්ෂිලත් පාර්ශ්ව වර්ගය | |
| සුරක්ෂිතලත් පාර්ශවය | |
| හඳුනාගැනීමේ අංකය | |
| සුරක්ෂිතලත් පාර්ශ්වයේ ලිපිනය | |
| | |

සටහන :

(i) *ණයකරු වර්ගය "පුද්ගලයකු" හෝ "ආයතනයක් " විය හැකිය ;*
(ii) *නේවාසික තත්ත්වය "දේශීය" හෝ "විදේශීය" විය හැකිය ;*
(iii) *ණයකරු හඳුනාගැනීමේ අංකය යන්නෙන් "ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍රයේ අංකය හෝ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය විය හැකිය ;*
(iv) *නම විය යුත්තේ ජාතික හැඳුනුම්පත් හෝ විදේශ ගමන් බලපත්‍රයේ දැක්වෙන සම්පූර්ණ නම හෝ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ දැක්වෙන ආයතන නාමය වේ ;*
(v) *සුරක්ෂිතලත් පාර්ශ්ව වර්ගය "පුද්ගයකු" හෝ "ආයතනයක් " විය හැකිය ;*
(vi) *සුරක්ෂිතලත් පාර්ශ්වය හඳුනාගැනීමේ අංකය ලේඛණය විසින් ලබාදෙනු ඇත ;*
(vii) *සමපාර්ශවීය ද්‍රව්‍යයේ විස්තරය යන්නෙන් සම පාර්ශ්වය ද්‍රව්‍ය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් අදහස් වේ ;*
(viii) *මූලික දැන්වීමේ අංකය යන්නෙන් මූලික ලියාපදිංචියේදී ලේඛනය විසින් ලබාදී ඇති ලිපිගොනු අංකය අදහස් වේ ;*
(ix) තත්වය ආරම්භයක දිනය සහ අවසාන දිනය ලේඛනය විසින් ලබාදෙනු ඇත.

8. විනිශ්චිත ණයහිමියකුගේ සම්බන්ධතාවක් පිළිබඳ මූලික දැන්වීමක් ගොණු කිරීමට අදහස් කරන තැනැත්තකු විසින් එවැනි දැන්වීමක් VII උපලේඛනයේ සඳහන් ආකෘති පත්‍රයට අනුව විද්‍යුත් මාධ්‍ය මගින් සුරක්ෂිතලත් ගනුදෙනු ලේඛනය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

VII වැනි උපලේඛනය

***විනිශ්චිත ණයහිමියකුගේ සම්බන්ධතාවක් පිළිබඳ මූලික දැන්වීමේ ආකෘති පත්‍රය***

| විනිශ්චිත ණයහිමියාගේ විස්තර | |
|---|---|
| | |
| විනිශ්චිත ණයහිමියාගේ වර්ගය | |
| නේවාසික තත්ත්වය | |
| විනිශ්චිත ණයහිමියාගේ හඳුනාගැනීමේ අංකය | |
| නම | |
| ලිපිනය | |
| | |
| විනිශ්චිත ණයකරුගේ විස්තර | |
| | |
| විනිශ්චිත ණයකරු වර්ගය | |
| විනිශ්චිත ණයකරුගේ හඳුනාගැනීමේ අංකය | |
| විනිශ්චිත ණයකරුගේ ලිපිනය | |
| | |
| නඩු තීන්දුවේ/ප්‍රදානයේ විස්තර | |
| නඩු අංකය<br>අධිකරණයේ විස්තර<br>තීරණයේ සාරාංශය | |

සටහන :

(i) *විනිශ්චිත ණයහිමියාගේ වර්ගය පුද්ගලයකු හෝ සංස්ථාවක් විය හැකිය ;*
(ii) *නේවාසික තත්වය දේශීය හෝ විදේශීය විය හැකිය ;*
(iii) *විනිශ්චිත ණයහිමියාගේ හඳුනාගැනීමේ අංකය ජාතික හැඳුනුම්පත් අංකය/විදේශ ගමන් බලපත්‍ර අංකය හෝ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ අංකය විය හැකිය ;*
(iv) *නම විය යුත්තේ ජාතික හැඳුනුම්පතේ/විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් නම හෝ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ සඳහන් සංස්ථාපිත නාමය වේ ;*
(v) *විනිශ්චිත ණයකරු පුද්ගලයකු හෝ සංස්ථාවක් විය හැකිය ;*
(vi) *විනිශ්චිත ණයකරු හඳුනාගැනීමේ අංකය, ලේඛනය (ක්‍රිබ්) විසින් සැපයිය යුතුය.*

9. මෙම නියෝගවල කාර්ය සඳහා :-

සංශෝධනය යන්නට -

(i) ලියාපදිංචියේදී සුරක්ෂිතලත් පාර්ශ්වයන් දෙකක් හෝ වැඩි ප්‍රමාණයක් සඳහන් වී ඇති විට යම් සුරක්ෂිත පාර්ශ්වයක නම ඉවත් කිරීම ;
(ii) සුරක්ෂිලත් පාර්ශ්වයන් එක් කිරීම ;
(iii) ලියාපදිංචියේදී ණයකරුවන් දෙදෙනෙකු හෝ වැඩි ප්‍රමාණයක් සඳහන් වී ඇති විට යම් ණයකරුවකුගේ නම කපා හැරීම ;
(iv) ණයකරුවකු එක් කිරීම ;
(v) සමපාර්ශවය ද්‍රව්‍ය මුදා හැරීම හෝ එක් කිරීම ;
(vi) ණයකරුවකුගේ නම වෙනස් කිරීම ;
(vii) සුරක්ෂිතලත් පර්ශ්වකරුවකුගේ නම වෙනස් කිරීම ;
(viii) සුරක්ෂිතලත් පාර්ශ්වකරුවකු විසින් අයිතිවාසිකම් යමෙකුට පැවරීම ;
(ix) සුරක්ෂිතලත් පාර්ශ්වයක් විසින් අයිතිවාසිකම් උපසේවී කිරීම ;
(x) සුරක්ෂිතලත් පාර්ශ්වයක අයිතිවාසිකම් ප්‍රතිනිවේශනය හෝ පුද්ගලාදේශය කිරීම ;

(xi) ණයකරුවකුගේ හෝ සුරක්ෂිත ලත් පාර්ශ්වයක ලිපිනය සංශෝධනය කිරීම ;

(xii) සුරක්ෂිතය වෙනුවෙන් ලබාගත් උපරිම මුදල වෙනස් කිරීම.

අදහස් වේ.

"මූලික දැන්වීම" යන්නෙන් 2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනතේ 11 වැනි 12 වැනි වගන්තිවල විධිවිධාන ප්‍රකාරව ගොනු කරන ලද දැන්වීමක් අදහස් වේ ;

"සුරක්ෂිතලත් පාර්ශ්වය" යන්නෙන් 2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනතේ 25 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ගොනුකරන ලද දැන්වීමක් අදහස් වේ ;

"සුරක්ෂිතලත් ගනුදෙනු ලේඛනය" යන්නෙන් 2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනතට අනුකූලව 1990 අංක 18 දරන ණය තොරතුරු කාර්යාංශය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනය අදහස් වේ.

08-537

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.